**හපුතලේ ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**
----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 30 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට හපුතලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
-----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

(අ) ඉකුත් වර්ෂයේ ලැබිය යුතු ගව මස් කඩ කුලී හා වෙළඳ කඩ කුලී රු.231,229 ක් අඩුවෙන් ගිණුම්ගත වීමේ වරද නිවැරදි කිරීමේදී සමුච්චිත අරමුදලට බැර කර නොතිබීම හේතුවෙන් එම වටිනාකමින් සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගෙන 2018 පෙබරවාරි 19 දින වෙන්දේසි කර තිබුණු රු.36,665 ක භාණ්ඩ අයිතම 21 ක් පොත් වලින් කපා නොහැර එම මුදල ආදායම් විදයම් ගිණුමටගත කිරීම හේතුවෙන් අතිරික්තය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සළසා නොතිබුණි.

1.3.2 **නොසැසඳුනු ගිණුම්**
----------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන අතර නොසැසඳුනු වෙනස්කම් වල වටිනාකම රු.4,338,728 ක් විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
-------------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**
--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු27,561,939 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ තුළ වර්ෂයක් හිඟහිටි වරිපනම් රු.199,557 ක්,වරෙන්තු ගාස්තු හා දඩ රු.13,832,ක්, කඩකුලී රු.716,158 ක්, වර්ෂ

02ක් හිඟහිටි වෙනත් ආදායම් රු.389,983 ක්, වාහන බදු රු.681,829 ක් හා හිඟහිටි කර්මාන්ත ආධාර රු.25,560,580ක් ඇතුළත් වී තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.28,896,196 ක් වූ ගෙවිය යුතු ශේෂය තුළ වර්ෂ 02 ක් වූ කර්මාන්ත ණයහිමියෝ රු.27,714,812 ක් හා වර්ෂ 01 ක් වූ වියදම් ණයහිමියෝ රු.1,181,384 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

ඔප්පු,පිඹුරුපත් හා දීමනාපත්‍ර ඇතුලුව අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු. 75,854,579 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව විගණනයේදි සතුටුදායක ලෙස සත්‍යාපනය/සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **අනුකූල නොවීම්**

1.3.5.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|
| | | **රු.** | |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | | |
| (i) | 49 හා 52 වගන්ති | - | 2017 වර්ෂය තුල සභා බලප්‍රදේශය තුල අනවසර ඉදි කිරීම් 28 ක් හඳුනාගෙන තිබුණු නමුත්,ඒවා නිරවුල් කර ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. |
| (ii) | 134 (2) වගන්තිය | - | දියුණු ප්‍රදේශවල හෝ කොටස්වල සංවර්ධන මට්ටම් සැලකිල්ලට ගෙන වරිපනම් බදු තීරණය කළයුතු වුවද , එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | | වර්ෂයකට වරක් හෝ ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂා කිරීම සිදුකල යුතු වුවත් ,2016 හා 2017 වර්ෂ වලට අදාල ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඈ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XXIV වන පරිච්ඡේදයේ 4 වගන්තිය | 49,274 | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලැබූ හා සේවය හැරගොස් සිටි සේවකයින් 10 ගෙන් අයවිය යුතු සේවක ණය ශේෂ අයකරගෙන නොතිබුණි. |
| (ඇ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) | මුදල් රෙගුලාසි 371 | 31,700 | තත්කාර්ය අත්තිකාරම් අදාළ කාර්යය නිම වූ වහාම පියවිය යුතු වුවද, 2017 දෙසැම්බර් 31 දින වන විටත් නොපියවූ අත්තිකාරම් විය. |
| | (ii) | මුදල් රෙගුලාසි 571 | 233,021 | පොදු තැන්පත් ගිණුමේ වර්ෂ දෙක ඉක්මවූ තැන්පතු 09 ක් නියාදනය කර නොතිබුණි. |
| (ඉ) | | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | 2017 වර්ෂය තුලදී වාහන 04 ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඊ) | | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | - | පළාත් පාලන ආයතන මඟින් පවත්වාගෙන යනු ලබන වෙළඳපොල කඩ කාමර සඳහා මාසික බදු කුලිය වසර 05 කට වරක් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් තක්සේරු කරගත යුතු වුවද, සභාව සතු කඩ කාමර 42 ක් සම්බන්ධයෙන් එවැනි තක්සේරුවක් සිදු නොකර, සභාව විසින් තීරණය කල මාසික කුලී අය කෙරෙමින් පැවතුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,583,012 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,598,636 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 669,900 | 669,900 | 1,020,219 | 199,754 | 619,900 | 619,900 | 701,427 | 127,681 |
| (ii) | කුලී | 6,106,935 | 6,106,935 | 6,454,842 | 716,157 | 5,741,521 | 5,741,521 | 6,305,063 | 191,560 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 615,300 | 615,300 | 794,675 | -- | 540,300 | 540,300 | 563,978 | 6,950 |
| (iv) | වෙනත් ආදායම් | 47,774,005 | 47,774,005 | 78,173,723 | 3,129,570 | 43,133,757 | 43,133,757 | 46,699,304 | 12,387,335 |
| | එකතුව | 55,166,140 | 55,166,140 | 86,443,459 | 4,045,481 | 50,035,478 | 50,035,478 | 54,269,772 | 12,713,526 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය**

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 55.2 ක් වූ අතර, වර්ෂය තුලදී රැස්කල ආදායම රුපියල් මිලියන 86.4 ක් විය. කෙසේ නමුත් වර්ෂය අවසාන වන විට රුපියල් මිලියන 4.0 ක ආදායමක් රැස්කර ගැනීමට තිබුණු අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම සියයට 68.5 කින් පහල ගොස් තිබුණි.

2.2.3 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

2017 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවෙන් අයකර ගැනීමට පැවති උසාවි දඩ රු.1,160,879 ක් සහ මුද්දර ගාස්තු රු.3,488,600 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කාර්ය සාධනය**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

පනවා තිබුණු අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් 2017 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) **පාරිසරික ගැටළු**

------------------

1988 අංක 56 සහ 2000 අංක 53 දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු ව්‍යාපාර 02 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන නොතිබුණු අතර, 2017 වර්ෂය සඳහා පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ආයතන හඳුනා ගැනීම සඳහා වාර්ෂික සමීක්ෂණයක්ද සිදුකර නොතිබුණි.

(ඇ) **තිරසාර සංවර්ධන ඉලක්ක**

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 වනවිටත් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

හපුතලේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් දියතලාව පතන නැමැති ඉඩමේ පර්චස් 8.75 ක් බැගින් වූ ඉඩම් කැබලි දෙකක් ගිවිසුම්ගත නොවී බාහිර පාර්ශවයන් දෙකක් වෙත බදු පදනම මත ලබාදී තිබුණි.

3.3 **මානව සම්පත් කළමණාකරණය**

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තුනක් හා අතිරික්ත 19 ක් පැවතුනි.

3.4 **ප්‍රසම්පාදනය**

---------------

3.4.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

පහත සඳහන් නිරික්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.7,022,644 ක් වූ ප්‍රජා පාදක කොන්ත්‍රාත් 11 ක් සඳහා ප්‍රජා පාදක සංවිධාන තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන අරමුණු සාක්ෂාත් වන පරිදි කටයුතු කළ යුතුය. මේ සඳහා ප්‍රාදේශිය ලේකම්වරයා විසින් පත් කරන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක අධීක්ෂණය තුළින් අදාල ප්‍රජා පාදක සංවිධානය ඇගයීමට භාජනය විය යුතු වුවත්, එසේ නොකර ප්රජා පාදක සංවිධාන තෝරාගෙන තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන කාර්යය පරිපාටි සංග්‍රහයේ 3.9.1 ඡේද ප්‍රකාරව එක්වරකට තුල සමිතියක් විසින් ඉටු කරනු ලබන මුලු කොන්ත්‍රාත් සංඛ්‍යාව තුනකට නොවැඩි විය යුතු වුවත්, ප්‍රාදේශිය සභාව විසින් ග්‍රාම සංවර්ධන සමිතියක් වෙත ව්‍යාපෘති පිරිනැමීමේදී ඉහත විධිවිධාන වලින් බැහැරව කර්මාන්ත හතරක් සඳහා එකවර ගිවිසුම් වලට එළඹී තිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 **අභ්‍යන්තර විගණනය**

-------------------------

2017 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වු අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | (i) | ස්ථාවර වත්කම් ලේඛනය නඩත්තු කර නොතිබීම. |
| | | (ii) | සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි නිවැරදිව හඳුනාගෙන නොතිබීම. |
| (ආ) | කොන්ත්‍රාත් පාලනය | (i) | කොන්ත්‍රාත් ලේඛනයක් නඩත්තු කර *නොතිබීම.* |
| (ඇ) | අභ්‍යන්තර පාලනය | (i) | ප්‍රාදේශීය සභාව විධිමත්ව අභ්‍යන්තර පරීක්ෂණ ක්‍රමයකට ලක්වන පරිදි එක් එක් නිලධාරීන්ට රාජකාරි හා වගකීම් බෙදා වෙන්කරන ආකාරයට රාජකාරි පවරා නොතිබීම. |
| (ඈ) | තොග පාලනය | (i) | ගබඩා පාලනය විධිමත්ව සිදු නොකිරිම හා ලේඛණ නඩත්තු කර නොතිබීම. |
| (ඉ) | වාහන පාලනය | (i) | වාහන හා යන්ත්‍රවල දෛනික ධාවන සටහන් විස්තර ලියා නොතිබීම. |
| | | (ii) | වාහන නඩත්තු කිරීම සම්බන්ධව කාර්මික නිලධාරීන්ගේ අධීක්ෂණය ලබාගෙන නොතිබීම. |